සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**8 ශ්‍රේණිය** | **නර්තනය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

# I - කොටස

- **සියලුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. සබරගමු නර්තන සම්ප්‍රදාය් පා සරඹ සඳහා භාවිතා කරනු ලබන නාමය වන්නේ,
    (1) පා සරඹ (2) දොඹින පද (3) මණ්ඩි පද (4) ඉලංගම් සරඹ

02. ''තත්, ජිත්, තොං, නං'' උඩරට නර්තන සම්ප්‍රදායේ,
    (1) කස්තිරමක් වේ. (2) සතර බීජාක්ෂර වේ.
    (3) අඩව්වක් වේ. (4) හමාර පදයක් වේ.

03. වෛරොඩි වන්නමට අදාළ බෙර පදය වන්නේ,
    (1) කුද ගත ගත දොම් (2) ජිං ජිං ගත කුද
    (3) දොං ජිංත ගත දොංත (4) ජිං ගත ගො ගො

04. නම්‍යතා අභ්‍යාසය කිරීම මඟින් වර්ධනය කරගත හැක්කේ,
    (1) නර්තන හැකියාව, ඇතිකර ගැනීමයි. (2) රස වින්දනය ඇති කිරීමයි.
    (3) ගායනය කිරීමට හැකිවීමයි. (4) ශරීරයේ ස්ථුලතාවය පාලනය යි.

05. ''සූරිය කුල ඇති හිරු දෙවියන් නේ'' මෙය,
    (1) ලී කෙළි කවියකි. (2) පතුරු කවියකි. (3) සවරං කවියකි. (4) කළගෙඩි කවියකි.

- **ප්‍රශ්න අංක 6 - 10 දක්වා වූ ප්‍රශ්න හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

06. සත්ව චරිතයක් නිරූපණය කිරීමේ දී එම සත්වයාගේ චර්යා ලක්ෂණ හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. ( )

07. වෛරොඩි වන්නමේ කවිවලින් කෙහෙතු ග්‍රහයා සහ ඊශ්වර දෙවියන් පිළිබඳ කියැවේ. ( )

08. මිහින්තලේ සිංහ පොකුණු කටට උඩින් ඇත්තේ බෙර වාදක රූපයකි. ( )

09. දුර්ගා දේවිය සත්‍යයට හා බලයට අධිපති දේවතාවිය යි. ( )

10. ගොප් ගෙඩියක් නිර්මානය කිරීම සඳහා ගොප් කොළ සහ කාඩ්බෝඩ් යොදා ගනී. ( )

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා 'අ' කොටසේ ඇති පදවලට ගැළපෙන පද කොටස ''ආ'' කොටසින් තෝරා යා කරන්න.**

| | (අ) | | (ආ) |
|---|---|---|---|
| 11. | ගොඩ සරඹ | ★ | වෙස් ඇඳුම් කට්ටලය |
| 12. | නම්‍යතා අභ්‍යාස | ★ | තුරඟා වන්නම |
| 13. | කොහොඹාකංකාරිය | ★ | කස්තිරම |
| 14. | සුළු මැදුම් දෙතිත | ★ | පත්තිනි දේවිය |
| 15. | පතුරු නැටුම | ★ | ශාරීරික යෝග්‍යතාව |

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(විජයදසම් / පතුරු නැටුම් / ප්‍රස්තාරකරණයේ දී / සිලින්ඩරාකාර / සවරම)

16. සිරුරේ විවිධ ස්ථානවලට තට්ටු කර හඬ උපදවමින් ........................................................................... නර්තනය කරයි.

17. නවරාත්‍රී උත්සවයේ 10 වන දිනයේ පූජාව .................................................................... නමින් හැඳින්වේ.

18. ලීය දෙපස අලංකාර රැළි අලවා සාදාගන්නා රංග උපකරණය ................................................................... නම් වේ.

19. පහතරට බෙරය ................................................................ හැඩයෙන් යුක්ත වේ.

20. විභාග, සංකේත, මාත්‍රා යන පද ........................................................................ භාවිත වේ.

(මුළු ලකුණු =1 x 20 = 20)

## II - කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය සහ තෝරාගත් තවත් ප්‍රශ්න දෙකක් ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01. (i) පහතරට බෙරය හඳුන්වන තවත් නම් දෙකක් ලියා දක්වන්න.

(ii) පහතරට බෙරය වාදනය කරන අවස්ථා දෙකක් නම් කරන්න.

(iii) කොහොඹාකංකාරී ශාන්තිකර්මයේ චාරිත්‍ර විධි දෙකක් නම් කරන්න.

(iv) ගැමි නැටුම්වල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් ලියන්න.

(v) ඔබ ඉගෙන ගත් සවරම් කවියක් ලියන්න.

(ලකුණු 2 × 5 = 10)

02. (i) වෛරොඩි වන්නමේ බෙර පදය ප්‍රස්තාර කරන්න. (ලකුණු 03)

(ii) මාත්‍රා 4 + 4 තාල රූපයට අයත් කවි පදයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 03)

(iii) මාත්‍රා 2 + 3 තාල රූපයට අයත් අඩව්වක් ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

03. (i) නවරාත්‍රී උත්සවයේ දී පිදුම් ලබන දේවතාවියන් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

(ii) නවරාත්‍රී උත්සවය පැවැත්වීමේ හේතු 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) නවරාත්‍රී උත්සවයේ දී දැකිය හැකි ප්‍රධාන සැරසිල්ල නම් කර ඒ පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

04. රූකම් ඇසුරෙන් නර්තන කලාව පැවති බවට තොරතුරු හමුවේ. ඒ ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| රූකම් වර්ග | ස්ථානය | සාධකය (තොරතුරු) |
|---|---|---|
| (i) ................................ | දැදිගම කොටවෙහෙර සූතිඝර චෛත්‍ය | ඇත් පහනේ නළඟනකගේ ලෝහමය රූපයක් ඇත. |
| සිතුවම් | (ii) ................................ | භරත නැටුමේ දී භාවිත කෙරෙන හස්ත මුද්‍රා දක්නට ලැබේ. |
| (iii) ................................ | ඇම්බැක්කේ දේවාලය | (iv) ................................ |
| ගල්කැටයම් | (v) ................................ | කණුවල උඩැක්කි හා එකැස් බෙර දක්නට ඇත. |

(i) (ලකුණු 02)

(ii) (ලකුණු 02)

(iii) (ලකුණු 02)

(iv) (ලකුණු 02)

(v) (ලකුණු 02)

(මුළු ලකුණු 10)

05. (i) ගොප් ගෙඩිය නිර්මාණය කිරීම සඳහා පරිසරයෙන් යොදා ගන්නා අමුද්‍රව්‍ය 03 ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) ගොප් ගෙඩිය භාවිතයට ගන්නා අවස්ථා 03 ක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ගොප් ගෙඩියක රූප සටහනක් ඇඳ දක්වන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. 3　　06. ✓　　11. කස්තිරම　　16 පතුරු නැටුම්
02. 2　　07. ✓　　12. ශාරීරික යෝග්‍යතාව　　17 විජයදසම්
03. 4　　08. ×　　13. වෙස් ඇඳුම් කට්ටලය　　18 සවරම
04. 1　　09. ✓　　14. තුරඟා වන්නම　　19 සිලින්ඩරාකාර
05. 2　　10. ×　　15. පත්තිනි දේවිය　　20 ප්‍රස්තාරකරණයේ දී

(1 x 20 = 20)

## II කොටස

01. (i) දෙවොල් බෙරය / රුහුණු බෙරය / දිග් බෙරය / සොෂක බෙරය / යක් බෙරය

(ii) ශාන්තිකර්මවල වාදනය / මගුල් බෙර වාදනය / පින් බෙර වාදනය / පෙරහැර උත්සවවල වාදනය / වැදුම් අත්, දැකුම් අත් වාදනය

(iii) කප් සිටුවීම. / තොට පේ කිරීම. / මඩු පේ කිරීම. / මල පේ කිරීම. / ආභරණ වැඩමවීම හෙවත් දෙවියන් වැඩම වීම. / මංගල භේරි වාදනය

(iv) සරළ බව / සාමූහිකත්වය / අව්‍යාජබව / විනෝදාස්වාදය / එමකම / ආවේණික කවි ගායනා

(v) සවරං කවියක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2× 5 = 10)

02. (i)

| 1́ | 2 | 3 | 1́ | 2 | 3 | 1́ | 2 | 3 | 1́ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජිං | - | ග | ත | ගො | ගො | ජිං | - | ග | ත | ගො | ගො |

විභාග සහ මාත්‍රා නම් කිරීමට ලකුණු 01
ප්‍රස්තාරකරණයේ නිවැරදි බවට ලකුණු 02
මුළු ලකුණු 03

(ii)

| 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | මල් | ග | ව | සා | - | ලා | - | කොන් | - | ඩ | ය | බැ | ද | ලා | - |
| + | ඉන | ත | ද | ක | ර | ස | එ | පැ | ළ | ද | ගෙ | නේ | - | - | - |

විභාග සහ මාත්‍රා නම් කිරීමට ලකුණු 01
ප්‍රස්තාරකරණයේ නිවැරදි බවට ලකුණු 02
මුළු ලකුණු 03

(iii) තත් තකට තක රොං
තත්කඩ තක්කඩ කුද තක රොං
තක රොං ගජිං ජිකුද　(ලකුණු 04)
කිටිතකට කුන් දත් ජික රොං　(මුළු ලකුණු 10)

03. (i) දුර්ගා දේවිය / ලක්ෂ්මි දේවිය / සරස්වතී දේවිය　(ලකුණු 03)

(ii) සශ්‍රීයක්වය පැතීම. / සෞභාග්‍ය ප්‍රාර්ථනා කිරීම / අධ්‍යාපනය කටයුතු ආරම්භ කිරීම.　(ලකුණු 03)

(iii) තට්ටු නවයකින් යුත් ආසනය / එම තට්ටු නවය දේව රූපවලින් හා නොයෙකුත් සෙල්ලම් බඩුවලින් අලංකාර කර ගැනීම. / අවසාන තට්ටුවේ ඇට වර්ග 9 ක් ගෙන ඒවා පැළවෙන්නට තබා එම පැළ වර්ග නවය එහි තැබීම. / මෙම තට්ටු නවය 'කොලු' ලෙස හැඳින්වීම.　(ලකුණු 04)

(මුළු ලකුණු 10)

04. (i) මූර්ති　(ii) සීගිරිය　(iii) ලී කැටයම්

(iv) බාල්කයක කැටයම් කර ඇති ලී කෙළි නැටුමක් ඇත. (ඩ) මැදිරිගිරිය වටදා ගෙය

(ලකුණු 2 × 5 = 10)

05. (i) කෙසෙල් කොට (කෙසෙල් බොඩ) - අවශ්‍ය උස ප්‍රමාණයට අනුව / ගොප් කොළ / ගොප් ඉරටු / පොල් කොළ　(ලකුණු 03)

(ii) උත්සව අවස්ථාවල දී වේදිකාව සැරසීම සඳහා / පිරිත් මණ්ඩප අලංකාර කිරීම සඳහා / මංගල පෝරු අලංකරණය සඳහා / අධ්‍යයන කටයුතු සඳහා / සුබ කටයුතු අවස්ථාවල දී　(ලකුණු 03)

(iii) රූප සටහන් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.　(ලකුණු 04)

(මුළු ලකුණු 10)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**8 ශ්‍රේණිය** | **නර්තනය**

නම/ විභාග අංකය:

## ප්‍රායෝගික පරීක්ෂණය

01. (i) කැමති ගායනයක් කිරිම. (ල. 05)

 (ii) නම් කරන ලද ගායනය (පතුරු හෝ සවරං) (ල. 05)

 (මුළු ලකුණු 10)

02. (i) 5 - 6 ගොඩ සරඹවලින් කැමති සරඹයක් නර්තනය කිරීම. (ල. 05)

 (ii) අදාළ සරඹයේ කස්තිරම නර්තනය කිරීම. (ල. 05)

 (මුළු ලකුණු 10)

03. වෛරොඩි වන්නම නර්තනය කිරීම.

 ⋆ ගායනය කිරීම. (ල. 02)
 ⋆ මාත්‍රා 02 ක් නර්තනය කිරීම. (ල. 04)
 ⋆ කස්තිරම නර්තනය කිරීම. (ල. 04)

 (මුළු ලකුණු 10)

04. පතුරු හෝ සවරං ගැමි නැටුමක් නර්තනය කිරීම. (ල. 10)

05. සත්ව චරිත නිරූපණය කිරීම.

 අලියා / සිංහයා / මොනරා /කුකුළා / උකුස්සා /අවශ්වයා (ල. 10)

 (මුළු ලකුණු 50)